**කුවේට් අරමුදල්වලින් පාලම් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - 2013**

---

කුවේට් අරමුදල්වලින් පාලම් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 1995 මාර්තු 27 දින හා 2001 සැප්තැම්බර් 03 දින එළඹි පිළිවෙලින් අංක 627 හා අංක 466 දරන ණය ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

පාලම් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ ණය ගිවිසුම් වලට අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය (මා සං අ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනවල ප්‍රවාහන පිරිවැය අඩුකිරීම හා දිවයිනේ පළාත් හා අග නගරය අතර ගමන් කිරීමට ගතවන කාලය අඩු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට සහාය දීම ව්‍යාපෘතියේ අරමුණු වේ. පටු හා අබලන් පාලම් 32 ක් පුනරුත්ථාපනය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ ආදේශ කිරීම මගින් මාර්ග ආරක්ෂාව වැඩි දියුණු කිරීම හා ගැටඹේ - ගන්නෝරුව මාර්ගය පුළුල් කිරීමද ව්‍යාපෘතියේ ඉලක්කයන් වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 3,432 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 10.12 ක් වන අතර ඉන් රු.මිලියන 1,728.22 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 5.1 ක් පාලම් පුනරුත්ථාපනය ප්‍රතිසංස්කරණය කිරීම හා ආදේශ කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන ලද අතර එය මූල්‍යයනය කිරීම සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (KFAED) එකඟ වී තිබුණි. 1995 මාර්තු 27 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 1997 දෙසැම්බර් 31 වන විට මාස 33 ක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණි. මෙම කාල පරිච්ඡේදය 2014 දෙසැම්බර් 31 දක්වා තවත් වර්ෂ 13 කින් අවස්ථා 7 කදී දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට

අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

( අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

## 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. මිලියන 29.22 ක් වූ අතර , 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 3,247.84 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| කෙරීගෙන යන වැඩ | 29.22 | 102.30 | 3,247.84 |
| | 29.22 | 102.30 | 3,247.84 |

## 5. විගණන නිරීක්ෂණ

## 5.1 ගිණුම්කරණ අඩුපාඩු

වර්ෂ 8 ක කාලයක් තිස්සේ හිට පැවති රු.10,000 ක් වූ ලබා දෙන ලද අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත්, ව්‍යාපෘතිය විසින් එම ශේෂ නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | | 2013 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කළ සමුච්චිත අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|
| | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල | 5.10 | 1,728 | 29.50 | 0.064 | 29.22 | 3.52 | 1,586.32 |
| ශ්‍රී ලංකා රජය | 5.02 | 1,704 | - | - | - | - | 1,658.71 |
| එකතුව | 10.12 | 3,432 | 29.50 | 0.064 | 29.22 | 3.52 | *3,245.03 |

* එකතුව රු. මිලියන 2.81 ක් වූ උපචිත වියදම් සහ වෙනත් ගෙවිය යුතු මුදල් ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල් සමඟ මෙම මුදල එකඟ නොවේ.

## 6.2 ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී මාවනැල්ල නගරයේ අතුරු මාර්ගයක් ඉදිකිරීම සඳහා අත්පත් කරගන්නා ලද ඉඩම් සඳහා වන්දි ගෙවීමට ව්‍යාපෘතිය විසින් රු.277,576 ක මුදලක් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත මුදාහැර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 12 ක් ගතවීමෙන් පසුවත් ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් අයිතිකරුවන්ට වන්දි ගෙවීම් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) තවද, ව්‍යාපෘති කටයුතු හේතුවෙන් වෙනත් අවතැන් වූ පුද්ගලයන්ට ගෙවිය යුතු එකතුව රු.38,500 ක් වූ වන්දි මුදල් වර්ෂ 13 ක් ගතවීමෙන් පසුවත් නිරවුල් කර නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා ප්‍රමාදයන් මත පොලිය රු.35,451 ක් විය.

## 6.3 භෞතික කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, පාලම් 32 සහ මාර්ග කොටස් පුළුල් කිරීම 2012 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. කෙසේ වුවද කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවති රු.86,813,815 කට සමාන වැය නොකළ කුවේට් ඩිනාර් 256,224 ක ඉතිරි මුදල ගාල්ල - දෙණියාය - මාදම්පේ මාර්ගය වැඩි දියුණු කිරීම් සඳහා වෙන්කර තිබුණි.